# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/18 - 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා - 2016.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/80 (29).

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලද නියෝග.

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2016 ආහාර (සීනි මට්ටම සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2016.08.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. කිසිදු තැනැත්තකු විසින් මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ආහාරයක්, 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ලේබල් කර ඇත්නම් මිස විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදාහැරීම හෝ ප්‍රචාරණය කිරීම නොකළ යුතු ය.

3. එම ආහාර අඩංගුවන බහාලුම් හෝ ඇසුරුම්වල පහත දැක්වෙන දේ වලට අනුකූල වූ ලේබලයක් තිබිය යුතු ය :-

(අ) II වන උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එහි අඩංගු සීනි ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තර ;

(ආ) II වන උපලේඛනයේ 2 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සාපේක්ෂ සීනි මට්ටම පිළිබඳ විස්තර ;

(ඇ) II වන උපලේඛනයේ 3 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සහ III වන උපලේඛනයේ නිරූපණය කර ඇති පරිදි වර්ණ ප්‍රදර්ශනය කිරීම ;

(ඈ) අදාළ සීනි මට්ටමට අදාළ වන වර්ණය නිශ්චිතව දක්වා ඇති III වන උපලේඛනය යටතේ දක්වා ඇති ලාංඡනයේ ඇතුළත වෘත්තයේ විෂ්කම්භය, සෙ. මී. 1 ට වඩා අඩු නොවිය යුතු ය ;

(ඉ) III වන උපලේඛනයේ ඇති විස්තරය මුද්‍රිත අකුරුවල ප්‍රමාණය මි. මී. 1.5 ක අවම උසකින් සමන්විත වන ලෙස සහ පැහැදිලිව කියවිය හැකි ලෙස තිබිය යුතු ය.

1A - PG 2941 — 507 (2016/05)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. සීනි මට්ටම පිළිබඳ විස්තරය, අවස්ථාවෝචිත පරිදි ඉහළ සීනි මට්ටම, මධ්‍යම සීනි මට්ටම හෝ අඩු සීනි මට්ටම ලෙස භාෂා තුනෙන්ම දක්වනු ලැබිය යුතු ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගයන් හි :-

''සීනි'' යන්නෙන්, ආහාරවල ඇති සියලු මොනෝසැකරයිඩ් සහ ඩයිසැකරයිඩ් අදහස් වේ ;
''කාබනේට් සහිත බීම'' යන්නෙන්, ජලයේ දියවන කාබන්ඩයොක්සයිඩ්, සීනි සහ වෙනත් අනුමත ද්‍රව්‍යයන් අඩංගු මධ්‍යසාර නොවන ජලය පාදක කොටගත් පාන වර්ගයක් අදහස් වේ ;
''පිරිනැමීම සඳහා සූදානම්ව ඇති ක්ෂණික පානය'' තනුක කිරීමෙන් තොරව පානය කිරීම අරමුණු කොටගත්තා වූ ද, පල්ප කොටසක් සහිතව හෝ රහිතව නොපැසවන ලද සහ එහෙත් පැසවිය හැකි වූ පළතුරු යුෂ හෝ දියාරු පළතුරු යුෂ හෝ සාන්ද්‍ර යුෂවලින් සකස් කළා වූ ද, දිය කළ හැකි යම් පැණි රසකාරක සහ බීමට සුදුසු ජලය අඩංගු වූ ද පළතුරු පානයක් අදහස් වේ ;
''පළතුරු නෙක්ටෝ'' යන්නෙන්, පළතුරු යුෂවලට සීනි, මී පැණි, පැණි සහ / හෝ සිරප් වර්ග හෝ පැණි රසකාරක සහ වෙනත් අනුමත ද්‍රව්‍ය එකතු කිරීමෙන් හෝ එකතු කිරීමෙන් තොරව ලබාගත් නොපැසවූ හෝ පැසවිය හැකි නිෂ්පාදනයක් අදහස් වේ ;
''පළතුරු යුෂ'' යන්නෙන්, සුදුසු ආකාරයෙන් යහපත් තත්ත්වයක් යටතේ නඩත්තු කරනු ලබන ප්‍රමාණවත් පරිදි පැසුනු සහ නැවුම් පළතුරුවල, පරිභෝජනයට ගත හැකි කොටසින් ලබා ගත්, නොපැසවූ එහෙත් පැසවිය හැකි දියරයක් අදහස් වේ.

2 වන නියෝගය

## I වන උපලේඛනය

කාබනේට් බීම -
කිරි පදනම් කරගත් නිෂ්පාදන හැර, බීමට පිරිනැමීම සඳහා සූදානම්ව ඇති ක්ෂණික පානය -
පළතුරු නෙක්ටා -
පළතුරු යුෂ -

3 වන නියෝගය

## II වන උපලේඛනය

සීනි මට්ටම සඳහා වර්ණ සංකේතවත් කිරීම

| *1 වන තීරය සීනි සංයුතිය (බීම මි.ලී. 100 සඳහා)* | *2 වන තීරය සාපේක්ෂ සීනි මට්ටම* | *3 වන තීරය වර්ණ සංකේත* |
|---|---|---|
| ග්‍රෑම් 11 ට වැඩි | ඉහළ සීනි මට්ටම | රතු |
| ග්‍රෑම් 2 සිට ග්‍රෑම් 11 දක්වා | මධ්‍යම සීනි මට්ටම | කහ පාට හුරු (ඇම්බර්) |
| ග්‍රෑම් 2 ට වඩා අඩු | අඩු සීනි මට්ටම | කොළ |

3 වන සහ 4 වන නියෝගය

## III වන උපලේඛනය

ලාංඡනය






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.